පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය
වෙළඳ අමාත්‍යාංශය
පුරප්පාඩු

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ පහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත් පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. සහකාර අධ්‍යක්ෂ (නීති හා බලගැන්වීම්) තනතුර - MM 1-1 (තනතුරු 02 යි)

රැකියා විස්තරය : පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියාකිරීම හා ඒවා දිස්ත්‍රික් මට්ටමින් සම්බන්ධීකරණය කිරීම, පනතේ විධිවිධාන පරිදි පරීක්ෂණ පැවැත්වීම, පනතේ විධිවිධාන පරිදි අධිකරණයේ පවරන ලද නඩු වලට අදාළ පැමිණිලි, චෝදනා පත්‍ර කෙටුම්පත් කිරීම, නඩු විභාග ස්වාධීනව පැවැත්වීම ඇතුළුව අධිකාරිය වෙනුවෙන් පෙනී සිටීම, වෙනත් නියාමන මණ්ඩල සමග අවශ්‍ය පරිදි හා අවශ්‍ය වූ විටදී සම්බන්ධීකරණය, පනතේ විධිවිධාන පරිදි අධිකාරිය මගින් එළඹෙන ගිවිසුම්, කෙටුම්පත් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ/ හෝ බලාත්මක කිරීම, අධිකාරියට එරෙහිව අධිකරණයේ පවරන ලද නඩු විභාග වලට අදාළව අවශ්‍ය ලිපිලේඛන සකස් කිරීම, නෛතික කරුණු පිළිබඳව අධිකාරියේ දිස්ත්‍රික් කාර්යාල අදාළ දිස්ත්‍රික් ලේකම්වරුන් හා සම්බන්ධීකරණය, දැනුවත්වීමේ වැඩ සටහන් සැළසුම් කිරීම සහ මෙහෙයවීම සහ අධ්‍යක්ෂ (නීති හා බලගැන්වීම්) විසින් පවරනු ලබන වෙනත් රාජකාරි කටයුතු සිදුකිරීම.

සුදුසුකම් :

බාහිර : සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක අවම වසර 03 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද සහිත නීතීඥවරයකු වීම.

අභ්‍යන්තර : පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කනිෂ්ඨ කළමනාකාර කාණ්ඩයේ (JM 1-1) I ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

වැටුප් පරිමාණය : MM 1-1 2016 රු. (53,175-10X1,375-15X1,910-95,575) ක.සේ.දෙ. චක්‍රලේඛන අංක 02/2016 නියමයන් පරිදි.

වයස : අවුරුදු 30 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

වෘත්තීය දීමනාව : ක.සේ.දෙ. චක්‍රලේඛ අංක 02/2016 පරිදි වෘත්තීය දීමනාවක් ගෙවනු ලැබේ.

02. සහකාර අධ්‍යක්ෂ (පරිපාලන හා මානව සම්පත්) තනතුර - MM 1-1- (තනතුරු 01 යි)

රැකියා විස්තරය : මානව සම්පත් සැලසුම් කිරීම, සේවකයින් බඳවාගැනීම් හා තෝරා ගැනීම, භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය අධීක්ෂණය කිරීම, මානව සම්පත් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙහිලා සහායවීම, විධායක මට්ටමේ නොවන සේවකයින්ගේ කාර්ය සාධනය සමාලෝචනය කිරීම, විධායක මට්ටමේ නොවන සේවකයින්ගේ විනය පිළිබඳ කරුණු සම්බන්ධයෙන් ක්‍රියා කිරීම, සහකාර අධ්‍යක්ෂ මට්ටමට අඩු පෞද්ගලික ලිපිගොනු භාරව කටයුතු කිරීම, කාර්යාලීය ප්‍රධාන කටයුතු පරිපාලනය කිරීම, මුද්‍රණ කටයුතු, ගබඩාව හා ඉන්වෙන්ට්‍රි වල නිරතවීම, පැමිණීම, නිවාඩු සහ ආයතනික කරුණු අධීක්ෂණය කිරීම හා උපදේශනය, අදාළ රජයේ චක්‍රලේඛන සමග යාවත්කාලීනව සිටීම, කාර්ය මණ්ඩල ස්ථාන මාරු යෝජනාක්‍රම ක්‍රියාත්මක කිරීම, මානව සම්පත් කළමනාකරණ පද්ධති ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම, පුහුණු කිරීමේ අවශ්‍යතා විශ්ලේෂණය සහ පුහුණු සැලසුම් සහ ක්‍රියාත්මක කිරීම සංවිධානය, සේවක වරප්‍රසාද ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම, සේවා සපයන්නන්ගේ සියලු ගිවිසුම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම, අධ්‍යක්ෂ (පරිපාලන හා මානව සම්පත්) විසින් පවරන වෙනත් රාජකාරීන්.

සුදුසුකම් :

බාහිර : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් මානව සම්පත් කළමනාකරණය, පිරිස් කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය හා රාජ්‍ය පරිපාලනය පිළිබඳ ප්‍රථම උපාධිය සමග මානව සම්පත් කළමනාකරණය සහ පරිපාලනය පිළිබඳ සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක අවම වසර 03 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

අභ්‍යන්තර : පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කනිෂ්ඨ කළමනාකාර කාණ්ඩයේ (JM 1-1) I ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

වැටුප් පරිමාණය : MM 1-1 2016 රු. (53,175-10X1,375-15X1,910-95,575) ක.සේ.දෙ. චක්‍රලේඛන අංක 02/2016 නියමයන් පරිදි.

වයස : අවුරුදු 30 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

වෘත්තීය දීමනාව : ක.සේ.දෙ. චක්‍රලේඛ අංක 02/2016 පරිදි වෘත්තීය දීමනාවක් ගෙවනු ලැබේ.

03. සහකාර අධ්‍යක්ෂ (ප්‍රාදේශීය කටයුතු) තනතුර - MM 1-1 (තනතුරු 06)

රැකියා විස්තරය : දිස්ත්‍රික් මට්ටමේ සියලු ක්‍රියාකාරකම් වගකීම, ක්‍රියාකාරී සැලසුම් හා අයවැය සකස් කොට අධීක්ෂණය කිරීම, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්හි දිස්ත්‍රික් ලේකම්වරුන් හා දිස්ත්‍රික්කයේ අනෙකුත් ප්‍රධාන නිලධාරීන් හා සමග සම්බන්ධීකරණය වීම, පවරන ලද කාර්ය සාධන ඉලක්කයන් සපුරා ගැනීම සඳහා ඒකකයන්ට සම්බන්ධිත සියලුම නිලධාරී සමග සම්බන්ධීකරණය, දිස්ත්‍රික් ඒකකයන්හි කාර්ය සාධනය ඉහළ නැංවීමට යෝජනා හඳුනාගෙන ඉදිරිපත් කිරීම, ප්‍රගති වාර්තා සකස් කොට ඉදිරිපත් කිරීම, ක්ෂේත්‍ර පරීක්ෂණ, වැටලීම් සහ පාරිභෝගික දැනුවත් කිරීම් වැඩසටහන් සැලසුම් කිරීම හා අධීක්ෂණය, පාරිභෝගික සමිති ස්ථාපනය සම්බන්ධීකරණය කිරීම, දිස්ත්‍රික් ඒකකයන්හි දත්ත ගබඩා නඩත්තු කිරීම, වෙළඳපළ සමීක්ෂණ සැලසුම් කොට අධීක්ෂණය කිරීම සහ වාර්තා ඉදිරිපත් කිරීම.

සුදුසුකම් :

බාහිර : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කළ විශ්වවිද්‍යාලයකින් ලබාගත් කළමනාකරණය, අලෙවිකරණය, ආර්ථික විද්‍යාව, වාණිජ්‍යය හෝ විද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධිය සමග සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක ව්‍යාපාරික හෝ වාණිජමය පරිසරයක අවම වසර 03 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

අභ්‍යන්තර : පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කනිෂ්ඨ කළමනාකාර කාණ්ඩයේ (JM 1-1) I ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

වැටුප් පරිමාණය : MM 1-1 2016 රු. (53,175-10X1,375-15X1,910-95,575). ක.සේ.දෙ. චක්‍රලේඛ අංක 02/2016 පරිදි

වයස : අවුරුදු 30 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

වෘත්තීය දීමනාව : ක.සේ.දෙ. චක්‍රලේඛ අංක 02/2016 පරිදි වෘත්තීය දීමනාවක් ගෙවනු ලැබේ.

04. සහකාර අධ්‍යක්ෂ (පාරිභෝගික කටයුතු හා තොරතුරු) තනතුර MM 1-1 (තනතුරු 02 යි)

රැකියා විස්තරය : අදාළ ව්‍යාපෘති පිළිබඳ ක්‍රියාකාරී සැලසුම් සහ අයවැය සකස් කිරීම හා අධීක්ෂණය, පාරිභෝගික අයිතීන්, වගකීම් සහ පාරිභෝගික කටයුතු පිළිබඳ මහජන දැනුවත්වීමේ වැඩසටහන් සංවිධානය කිරීම, පාරිභෝගික කටයුතු පිළිබඳව වාර්ෂික උත්සවාංග, වැඩ මුළු, ප්‍රදර්ශන සහ සල්පිල් සංවිධානය කිරීම, පාරිභෝගික සංවිධාන ස්ථාපනය කිරීම, මහජන දැනුවත් කිරීමේ වැඩ සටහන් වල ප්‍රගතිය ප්‍රවර්ධනය කිරීම සහ අධීක්ෂණය, කාර්ය සාධන වාර්තා, මාධ්‍ය වාර්තා/ නිවේදන සකස් කොට ඉදිරිපත් කිරීම, අධ්‍යක්ෂ (පාරිභෝගික කටයුතු හා තොරතුරු) විසින් පවරනු ලබන වෙනත් රාජකාරීන්.

සුදුසුකම් :

බාහිර : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් කළමනාකරණය, අලෙවි කරණය, ආර්ථික විද්‍යාව, වාණිජ්‍යය හෝ විද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධියක් සමග සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක ව්‍යාපාරික හෝ වාණිජමය පරිසරයක අවම වසර 03 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

අභ්‍යන්තර : පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කනිෂ්ඨ කළමනාකාර කාණ්ඩයේ (JM 1-1) I ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර 03 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

වැටුප් පරිමාණය : MM 1-1 2016 රු. (53,175-10X1,375-15X1,910-95,575) ක.සේ.දෙ. චක්‍රලේඛ අංක 02/2016 නියමයන් පරිදි.

වයස : අවුරුදු 30 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

වෘත්තීය දීමනාව : ක.සේ.දෙ. චක්‍රලේඛ අංක 02/2016 පරිදි වෘත්තීය දීමනාවක් ගෙවනු ලැබේ.

05. සහකාර අධ්‍යක්ෂ (තරගකාරීත්ව ප්‍රවර්ධන) තනතුර MM 1-1 (තනතුරු 01 යි)

රැකියා විස්තරය : භාණ්ඩ හා සේවා සඳහා වෙළඳපළ පාලනයේ ඒකාග්‍රතාව විභාගකර බැලීම, වෙළඳපළ පාලනයේ අනිසි යෙදවීම් පිළිබඳව සෝදිසි කිරීම හා අවශ්‍ය පැමිණිලි පරීක්ෂණ පැවැත්වීම, තරගකාරී නොවන/ අයුතු වෙළඳ ව්‍යවහාරයන්ට අදාළව සෝදිසි කර බැලීම, පර්යේෂණ ව්‍යාපෘති සැලසුම් කිරීමේ, ක්‍රියාත්මක කිරීමේ හා ඇගයීමේ කටයුතු වලට සහාය වීම, පර්යේෂණ වාර්තා සකස් කිරීම, තරගකාරී නොවන ව්‍යවහාරයන් සහ වෙළඳ වගකීම් පිළිබඳ පක්ෂපාතීත්වය පිළිබඳ දැනුවත්වීමේ වැඩසටහන් සැලසුම් කොට ක්‍රියාත්මක කිරීම, තරගකාරී ප්‍රතිපත්තියෙහි වත්මන් ආර්ථික කටයුතු පිළිබඳ දැනුම හා සම්බන්ධ ගෝලීය ප්‍රවණතා සමග සම්බන්ධතා පවත්වාගෙන යාම, දත්ත ගබඩා පවත්වාගෙනයාම, අධ්‍යක්ෂ (තරගකාරීත්ව ප්‍රවර්ධන) විසින් පවරනු ලබන වෙනත් රාජකාරීන්.

සුදුසුකම් :

බාහිර : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ආර්ථික විද්‍යාව, සංඛ්‍යානය හෝ අලෙවිකරණය පිළිබඳ උපාධියක් සමග සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක ව්‍යාපාරික හෝ වාණිජමය පරිසරයක අවම වසර 03 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

අභ්‍යන්තර : පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කනිෂ්ඨ කළමනාකාර කාණ්ඩයේ (JM 1-1) I ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

වැටුප් පරිමාණය : MM 1-1 2016 රු. (53,175-10X1,375-15X1,910-95,575) ක.සේ.දෙ. චක්‍රලේඛ අංක 02/2016 පරිදි.

වයස : අවුරුදු 30 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

වෘත්තීය දීමනාව : ක.සේ.දෙ. චක්‍රලේඛ අංක 02/2016 නියමයන් පරිදි වෘත්තීය දීමනාවක් ගෙවනු ලැබේ.

06. සහකාර අධ්‍යක්ෂ (මිලකිරීම් හා කළමනාකරණ) තනතුර MM 1-1 (තනතුරු 01 යි)

රැකියා විස්තරය : භාණ්ඩ හා සේවා මිල කිරීම කළමනාකරණය කිරීම සඳහා සහායවීම, භාණ්ඩ හා සේවාවන්හි පිරිවැය ව්‍යුහයන් සකස් කිරීම, වරණීය භාණ්ඩ හා සේවාවන්හි මිල ගණන් පරීක්ෂාකර බැලීම, පිරිවැය ඇගැයීම සහ නියාමනය, මිලකිරීමේ පරීක්ෂණ පැවැත්වීමට සහායවීම, මිලකිරීමේ ප්‍රශ්නයන් පිළිබඳ සාමයික සමාලෝචනයන්ට සහායවීම, වෙළඳපළ තත්වයන් පිළිබඳ දත්ත ගබඩා අධීක්ෂණය හා නඩත්තු කිරීම, ජාත්‍යන්තර/ දේශීය මිලගණන් සහ අත්‍යවශ්‍ය වෙළඳ භාණ්ඩ පිළිබඳ නිෂ්පාදන රටාවන් මිල කිරීමේ කරුණු පිළිබඳ වෙනත් අංශ සම්බන්ධීකරණය කිරීම හා සහාය වීම, කාර්යක්ෂම අධ්‍යයනයන් සැළසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා සහායවීම, පනතේ විධිවිධානයන් ප්‍රකාරව උපදේශාත්මක යොමුකිරීම පිළිබඳව විභාග කිරීම හා වාර්තා කිරීම සඳහා සහායවීම, අධ්‍යක්ෂ (මිල හා කළමනාකරණ) විසින් පවරනු ලබන වෙනත් රාජකාරීන්.

සුදුසුකම් :

බාහිර : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ගණකාධිකරණය, වාණිජ්‍යය හෝ මූල්‍ය කළමනාකරණය පිළිබඳ ප්‍රථම උපාධියක්

හෝ

ICASL,CIMA,ACCA හි අන්තර්/මධ්‍ය මට්ටමේ සහතිකයක්, සමග සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක වසර 03 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

අභ්‍යන්තර : පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කනිෂ්ඨ කළමනාකරු කාණ්ඩයේ (JM 1-1) I ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

වැටුප් පරිමාණය : MM 1-1 2016 රු. (53,175-10X1,375-15X1,910-95,575) ක.සේ.දෙ. චක්‍රලේඛ අංක 02/2016 නියමයන් පරිදි.

වයස : අවුරුදු 30 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

වෘත්තීය දීමනාව : ක.සේ.දෙ. චක්‍රලේඛ අංක 02/2016 නියමයන් ප්‍රකාරව වෘත්තීය දීමනාවක් ගෙවනු ලැබේ.

07. පද්ධති පරිපාලක (II ශ්‍රේණිය) තනතුර JM 1-1 (තනතුරු 01 යි)

රැකියා විස්තරය : පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ හි තොරතුරු පද්ධති කළමනාකරණය භාරව කටයුතු කිරීම, තොරතුරු තාක්ෂණය හා සම්බන්ධ සියලු කරුණු හැසිරවීම, අධ්‍යක්ෂ විසින් පවරනු ලබන වෙනත් රාජකාරීන්.

සුදුසුකම් :

බාහිර : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් තොරතුරු තාක්ෂණය පිළිබඳ ප්‍රථම උපාධිය සමග සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක පද්ධති/ තොරතුරු තාක්ෂණ පරිපාලක/ නිලධාරී හෝ සමාන තනතුරක අවම වශයෙන් වසර 06 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

අභ්‍යන්තර : බලාත්මක කිරීම්/ මෙහෙයුම්/ ව්‍යාප්ත කාණ්ඩයේ (MA 5-2) තනතුරක අවම වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

වැටුප් පරිමාණය : JM 1-1 2016 රු. (42,600-10X755-18X1,135-70,580) ක.සේ.දෙ. චක්‍රලේඛ අංක 02/2016 නියමයන් පරිදි.

වයස : අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

08. දත්ත සම්බන්ධීකාරක (II ශ්‍රේණිය) - MA 5-2 තනතුර (තනතුරු 01 යි)

රැකියා විස්තරය : දත්ත සමුදායන්හි දත්ත ඇතුළත් කිරීම, නඩත්තුව හා යාවත්කාලීන කිරීම, යෙදවුම් මෘදුකාංගය භාවිත කරමින්, දත්ත විශ්ලේෂණය හා වාර්තා නිරූපණය, වෙබ් අඩවි, දත්ත ඇතුළත් කිරීම යාවත්කාලීන කිරීම හා නඩත්තු කිරීම සහ අධ්‍යක්ෂවරයා විසින් පවරනු ලබන වෙනත් රාජකාරීන්.

සුදුසුකම් : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් තොරතුරු තාක්ෂණය/ තොරතුරු පද්ධති හෝ පරිගණක කරණය පිළිබඳ ප්‍රථම උපාධියක්.

අමතර සුදුසුකම් : අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් ආයතනයකින් පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම අතිරේක සුදුසුකමක් වනු ඇත.

වැටුප් පරිමාණය : MA 5-2 2016 රු. (36,850-10X755-15X930-5X1,135-64,025) ක.සේ.දෙ. චක්‍රලේඛ අංක 02/2016 නියමයන් පරිදිය.

වයස : අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

පොදු කොන්දේසි :

වෙනත් දීමනා : වැටුපට අමතරව අදාළ රජයේ චක්‍රලේඛ ප්‍රකාරව ජීවන වියදම් දීමනාව සහ වෙනත් අදාළ දීමනාද ගෙවනු ඇත.

පත්කිරීමේ ස්වභාවය : සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල සඳහා සහ අදාළ රජයේ චක්‍රලේඛ පරිදි ලැබීම් සඳහා හිමිකම් සහිත ස්ථිර තනතුරකි.

බඳවාගැනීමේ දී වැටුප : බාහිරව බඳවා ගනු ලබන පිරිස් වැටුප් පරිමාණයේ මූලික පියවරෙහි තබනු ඇත.

අභ්‍යන්තරව බඳවාගනු ලබන අය ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ විධිවිධාන පරිදි තීරණය කෙරේ

ස්ථිර කිරීම : පත්කරනු ලබන අයදුම්කරුවන් වසර 3 ක පරිවාස කාලයකට යටත්වේ. ඔහුගේ/ ඇයගේ කාර්ය සාධනය හා හැසිරීම පරිවාස කාලය තුළ සතුටුදායක වේ නම් ඔහු/ ඇය සේවයේ ස්ථිර කරනු ඇත. අභ්‍යන්තරව තෝරා ගන්නා අයදුම්කරුවන් දැනටමත් දරන තනතුරෙහි ස්ථිර කර ඇත්නම් ඔවුන් එක් වසරක වැඩ බලන කාලයකට යටත්ව පත් කරනු ලැබේ.

බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය : අධිකාරිය විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් මෙහෙයවන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

වෙනත් : ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතුය.

ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට එකඟ විය යුතුය.

තනතුරෙහි රාජකාරී මනාව ඉටුකිරීමට ශාරීරිකව හා මානසිකව යෝග්‍ය විය යුතුය.

විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

සුදුසුකම්ලත් අයදුම්කරුවන්හට තම අයදුම්පත් මෙම දැන්වීමේ දින සිට දින 14 ක් ඇතුළත පහත සඳහන් ලිපිනය වෙත 2020-09-28 වන දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. සුදුසුකම් සනාථ කෙරෙන අදාළ සහතිකවල පිටපත් අයදුම්පතට අමුණා එවිය යුතුය. රාජ්‍ය අංශයේ සේවකයන්ගේ අයදුම්පත් තම ආයතන ප්‍රධානීන් මගින් එවිය යුතුය. ඉහත අවශ්‍යතාවලට අනුකූල නොවන, අසම්පූර්ණ හා අවසාන දිනට පසුව එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයථා බලපෑම් කිරීම නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ. ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය. කරුණාකර පහත ලිපිනය වෙත ඔබගේ අයදුම්පත් යොමු කරන්න.

අධ්‍යක්ෂ ජනරාල්,
පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය,
2 වන මහල, සතොස මහලේකම් කාර්යාල ගොඩනැගිල්ල,
නො. 27, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

Source: Dinamina, Daily News (2020.09.12)